# සමාජ අපචාර හා රූපවාහිනිය

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව(ජන සන්නිවේදනය) සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනය

නම :- එස් . ජී . එම් . සමරකෝන්

**ලි. ප. අංකය :- (MACO/99/088/R)**

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1233 |
| වර්ග අංකය: | |

ශාස්ත්‍ර වේදී උපාධි (ගෞරව),
කැළණිය විශ්ව විද්‍යාලය,

අධ්‍යාපන ඩිප්ලෝමා,
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය.

# සාරාංශය

පිළිගත් සමාජ චර්යාවලින් අපගමනය වී, පවතින සමාජ සම්මතයන්ට විරුද්ධව යමින් පිළිගත් නීතිරීති කඩ කරමින් දිනෙන් දින වර්ධනය වන සමාජ අපචාර, අද සමාජ ගැටළුවක් දක්වා වර්ධනය වී ඇත. ළමා හා තරුණ ප්‍රජාව අපචාර හා අපයෝජනයට නැඹුරු වීම සමාජ යහ පැවැත්මට හිතකර නොවන අතර එය සමාජ හැල හැප්පීම් ඇතිවීමට මෙන්ම සංස්කෘතික බිඳ වැටීමක් ඇතිවීම දක්වා වර්ධනය විය හැක. මෑත දශක කීපයක සිට සිදුවන අපචාර වර්ධනයට රූපවාහිනී මාධ්‍ය ඇතුළු අනෙකුත් මාධ්‍යයන්ගේ කෙබඳු බලපෑමක් ඇත්දැයි සොයා බැලීම මෙම නිබන්ධනයෙන් අපේක්ෂා කෙරේ.

රූපවාහිනිය නිසා ළමා මනස විකෘති වීම තුළින් ඇතිවිය හැකි සමාජ අපචාරවල ස්වභාවය කුමක්ද? සමාජ අපචාර වර්ධනය පාලනය කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග කවරේද? යන අරමුණු ඉටු කර ගැනීම මෙන්ම, ඉදිරි වැඩ සටහන් සම්පාදනයේදී අවශ්‍ය මඟ පෙන්වීමද මෙම නිබන්ධනයේ අරමුණු අතර විය.

පරිච්ඡේද හතරකින් සමන්විත මෙම නිබන්ධනයේ, පළමු පරිච්ඡේදයේ හැඳින්වීම, පසුබිම, පර්යේෂණ ගැටළු, ක්‍රමවේද හා සීමාවන් සාකච්ඡා කර ඇත.

දෙවන පරිච්ඡේදයෙන් න්‍යායාත්මක පදනම හා විවිධ මත විග්‍රහ කෙරේ. තෙවන පරිච්ඡේදයෙන් නිෂ්පාදිත වැඩ සටහන්, විද්වත් මත, හා ළමා අදහස් ඇතුළු දත්ත විශ්ලේෂණයක් සිදු කර ඇති අතර සිවුවන පරිච්ඡේදයෙන් නිගමන හා යෝජනා ඉදිරිපත් කර ඇත.

සමස්තයක් ලෙස ගත් කළ මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සමාජ අපචාර වර්ධනයට රූපවාහිනියේ බලපෑමක් ඇතිවූයේද යන්න සොයා බැලීම සහ එය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග විමසා බැලීමයි.


මූලික පද - අපචාර, ළමා අපචාර, ළමයා, මාධ්‍යය, අපරාධ

## Abstract

Today social abuse has become a major threat to every segment of society. Moreover, everyday irrespective of young and old people become victims to this social problem. Therefore, this dissertation aims at finding true solutions to the problem faced by the society due to social abuse and television, specially the distortion of child's mind due to the addiction to television.

This thesis consists of four chapters, mainly the introduction, the background, research problem and method. In this research data collect from both school students and experts of relevant area.

On the whole the research aim is to see whether television has and negative impact on the growth of social abuse and also to find remedial actions to prevent it. Finally the reveals that media has a negative impact on the social abuse. Prevent this problem is a social responsibility and these findings are more applicable and important to present society to take actions prevent this menace.

**Keywords** - Abuse, Child abuse, The child, Media, Crime